Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

**විෂය - විද්‍යාව**

**ශ්‍රේණිය - 10**


**සතිය - තුන්වන සතිය**

**සැකසුම - W. ශිරාණි, කෑ/දෙහි/වළගම්බා ම.වි.**

ශ්‍රී පාද වන්දනාවේ යන බැතිමතුන් කන්ද නගින විට ඔවුන්ගේ කන් ආවරණය වන පරිදි හිස් වැසුම් පළඳී.

1. එසේ කන් ආවරණය කරගැනීමට හේතුව කුමක්ද?

2. රූපයේ දක්වා ඇති රසදිය වායු පීඩනමානය ශ්‍රී පාද අඩවිය දක්වා රැගෙන යන ලදී. එහි රසදිය කඳෙහි උස 56 cm ලෙස සටහන්ව තිබිණි. ශ්‍රී පාද අඩවියේ එදින වායුගෝලීය පීඩනය ගණනය කරන්න.




( රසදිය ඝනත්වය 13600 kg $m^{-3}$, ගු. ත්. 10 $ms^{-2}$ )

3. පහත වගුව සම්පූර්ණ කරන්න.

| අවස්ථාව | වායු පීඩනය ක්‍රියාකරන ආකාරය |
|---|---|
| • බටයක් භාවිතයෙන් බීම පානය. | • |
| • සයිෆන් ක්‍රමයෙන් ටැංකියක ඇති ජලය ඉවත් කිරීම. | • |
| • රබර් චූෂකයේ ක්‍රියාව. | • |

4. පහත ක්‍රියාකාරකමෙහි නිරත වන්න. නිරීක්ෂණ හා නිගමනය සඳහන් කරන්න.

අවශ්‍ය ද්‍රව්‍ය :- ජල බේසමක් , රබර් බෝලයක්.

ක්‍රමය :- ★ ජල බේසමට රබර් බෝලය අතහරින්න.
★ බෝලය ජලය තුළ ගැඹුරට ගෙන ගොස් අතහරින්න.

නිරීක්ෂණ :- i.
ii.
නිගමනය :- iii.

5. වස්තුවක් ජලය තුළ අර්ධ වශයෙන් හෝ පූර්ණ වශයෙන් ගිලී ඇති විට එය මත ක්‍රියා කරන උඩුකුරු තෙරපුම වස්තුව මගින් විස්ථාපනය වූ ජලයේ බරට සමාන බව ආදර්ශනයට ක්‍රියාකාරකමක් යෝජනා කරන්න.